ද මැසිනොද් විද්‍යාලය, කඳාන.                28.07.2016

ඉතිහාසය I

ශ්‍රී ලංකාවේ ඉතිහාසය-අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා          (25 S-I)          කාලය පැය 1

Learning Resource Center
De Mazenod College
Kandana

මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වෙ. [illegible] වලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

I කොටස

- **අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවරහෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරා එහි අංකය වරහන තුළ ලියන්න.**

(1) 1. පූජාවලිය  2. ථූපවංසය  3. දාඨාවංසය
4. මන්දාරම්පුර පුවත  5. සරජෝතිමාලෙයි  (------)

(2) 1. දඹදෙණිය  2. යාපනය  3. ගම්පල
4. කෝට්ටේ  5. යාපහුව  (------)

(3) 1. පරුමක  2. ගමික  3. සෙනෙවිරද්
4. උත්තරමූල  5. රටික  (------)

(4) 1. ගොඩවාය  2. කොට්ටියාරම  3. පට්ඨානගාම
4. දේවනගර  5. ගෝකණ්ණ  (------)

(5) 1. කණිෂ්ක  2. කිත්සිරිමෙවන්  3. මානවම්ම
4. වෝහාරිකතිස්ස  5. සංඝතිස්ස  (------)

(6) 1. ලීලාවතී  2. අනුලා  3. රත්නාවලී
4. කල්‍යාණවතී  5. සංඝා  (------)

(7) 1. දේවානම්පියතිස්ස  2. උත්තිය  3. සූරතිස්ස
4. සිරිනාග  5. අසේල  (------)

(8) 1. මාඝ  2. විජය  3. පඬුවස්දෙව්
4. දිසායු  5. විජිත  (------)

(9) 1. පළවන විජයබාහු  2. දෙවන ගජබාහු  3. පළවන පරාක්‍රමබාහු
4. තුන්වන විජයබාහු  5. නිශ්ශංකමල්ල  (------)

(10) 1. ජගත් විජය  2. තණශිව  3. ලංකාපුර දණ්ඩනාථ
4. නන්දිමිත්‍ර  5. සේන  (------)

නොගැළපෙන යුගලය තෝරා එහි අංකය සඳහන් කරන්න

(11) 1. මල්වතු ඔය-අනුරාධගාම  2. ගල්ඔය-දීඝවාපි
3. කුඹුක්කන් ඔය-මහාගාම  4. කලා ඔය-උපතිස්සගාම
5. මැණික් ගඟ-කාජරගාම  (------)

(12) 1. මෙගස්තිනස්-පර්සියානු යුද්ධ  2. ක්වෙරෝස්-ලංකාධිපත්‍යය
3. ඇරිස්ටෝටල්-ඩිමුන්ඩෝ  4. රිබෙයිරෝ-ලංකා ඉතිහාසය
5. රොබට් නොක්ස්-එදා හෙළදිව  (------)

(13) 1. ගෝඨාභය-මාගම 2. දෙවන ගජබාහු-පොළොන්නරුව
3. පළවන කාශ්‍යප-සීගිරිය 4. පස්වන මිහිඳු-රුහුණ
5. පළවන අග්ගබෝධි- අනුරාධපුර (------)

(14) 1. සිතුල්පව්ව-චිත්තලපබ්බත 2. වලිකාමම්-වැලිගම
3. සල්වතොට-හලාවත 4. දේවනගර-දෙවිනුවර
5. අරිට්ඨ පබ්බත-රිටිගල (------)

(15) 1. සිරිමේඝවර්ණ රජු- හේමමාලා කුමරිය 2. දේවානම්පියතිස්ස රජු-මිහිඳු හිමි
3. මහානාම රජු-ෆාහියන් හිමි 4. මහසෙන් රජු-සංඝමිත්ත හිමි
5. දෙවන කාශ්‍යප රජු-බුද්ධඝෝෂ හිමි (------)

**X හා Y තීරු නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරා එහි අංකය වරහන තුළ ලියන්න**

(16)

| X | Y |
|---|---|
| 1 ඇළහැර ඇළ | A මහසෙන් රජු |
| 2 කන්තලේ වැව | B පණ්ඩුකාභය |
| 3 බසවක්කුලම වැව | C ධාතුසේන |
| 4 කලා වැව | D දෙවන අග්ගබෝධි |
| 5 කවුඩුලු වැව | E වසභ |

1. AEDCB 2. CDEAB 3. EDBCA 4. EBDCA 5. ECDAB (------)

(17)

| X | Y |
|---|---|
| 1 ගල්පොත ලිපිය | A හතරවන උදය රජු |
| 2 ගල්විහාර ලිපිය | B වසභ රජු |
| 3 වල්ලිපුරම් සන්නස | C පළවන විජයබාහු රජු |
| 4 හෝපිටිගමුව ලිපිය | D පළවන පරාක්‍රමබාහු රජු |
| 5 අඹගමුව ලිපිය | E නිශ්ශංකමල්ල රජු |

1. ADCBE 2. EDBAC 3. EBADC 4. EABDC 5. ABEDC (------)

(18)

| X | Y |
|---|---|
| 1 ථූපාරාමය | A පොළොන්නරුව |
| 2 කොටවෙහෙර | B මිහින්තලය |
| 3 සත්මහල්ප්‍රාසාදය | C දැදිගම |
| 4 දඹකොළවෙහෙර | D අනුරාධපුරය |
| 5 අම්බස්තල චෛත්‍ය | E යාපනය |

1. DCAEB 2. DBAEC 3.DEABC 4. ABECD 5. DACDE (------)

(19)

| X | Y |
|---|---|
| 1 හෝපිටිගමුව ලිපිය | A භික්ෂූන් සඳහාවූ නීතිරීති |
| 2 මිහින්තලා පුවරු ලිපි | B වෙළඳ නගරයක පාලනය පිළිබඳව |
| 3වෙවැල්කැටිය ලිපිය | Cරජවරුන් දෙදෙනෙකු අතරවූ ගිවිසුමක් පිළිබඳව |
| 4 වෙස්සගිරි පුවරු ලිපි | D ජලය බෙදාදීම දීම පිළිබඳව |
| 5 සංගමු විහාර ලිපිය | E අධිකරණ නීති පිළිබඳව |

1. BDECA 2. BEDCA 3. BADEC 4.BDCEA 5. BAEDC (------)

(20)

| X | Y |
|---|---|
| 1 පඬුවස්දෙව් රජු | A ස්වර්ණපාලි |
| 2 වට්ටගාමිණී රජු | B භද්දකච්චායනා |
| 3 පළවන විජයබාහු රජු | C කල්‍යාණවතී |
| 4 නිශ්ශංකමල්ල රජු | D තිලෝකසුන්දරී |
| 5 පණ්ඩුකාභය රජු | E සෝමා දේවි |

1. BDECA 2. BEDCA 3. BADEC 4. BDCEA 5. BAEDC (------)

ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ප්‍රශ්න සඳහා උපදෙස් සම්පිණ්ඩනය ඇසුරින් නිවැරදි පිළිතුරේ අංකය තෝරා ලියන්න

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| A හා B පමණක් නිවැරදිය | B හා C පමණක් නිවැරදිය | C හා D පමණක් නිවැරදිය | A හා C පමණක් නිවැරදිය | ප්‍රතිචාර එක් හෝ දෙකකට වැඩි ගණනක් නිවැරදිය |

21. ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස පිහිටුවීම සම්බන්ධ නිවැරදි ප්‍රකාශය

A මුල් ආර්යයෝ මෙරට වයඹදිග හා නැගෙණහිර ගංගා ආශ්‍රිතව ජනාවාස පිහිටවූහ

B විජිතගාම හා මහාගාම මුල් ආර්ය ජනපදවේ

C මෙරට සම්ප්‍රදායික ඓතිහාසික විස්තරය විජය පිළිබද පුරාවෘත්තයෙන් ආරම්භවේ.

D මුල් ආර්ය ජනයා අනුරාධපුරය සිය පාලන මධ්‍යස්ථානය කරගත්හ. (------)

22. රුහුණු රාජයයේ ඉතිහාසය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය

A මහානාග රජු රුහුණු රාජයය එක්සත් කළේය.

B මාගම රුහුණේ අගනුවර විය

C රුහුණේ පාලකයෝ විදේශික ආක්‍රමණ ඇතිවූ අවස්ථා වල රට නිදහස් කරගැනීමේ සටන් ව්‍යාපාර වලට උරදුන්හ.

D 1017 පසුව රුහුණ ලංකාවේ පාලන මධ්‍යස්ථානය විය. (------)

23. ලංකාවට බුදුදහම හදුන්වාදීම පිළිබඳව අදාල වෙන ප්‍රකාශ කවරේද

A දෙවන ධර්ම සංගායනාව පැවැත්වීම

B මිහිදු හිමිගේ පැමිණිම සිදුවීම

C සංඝමිත්තා තෙරණිය හා ශ්‍රී මහා බෝධිය වැඩමවීම

D දෙවනපෑතිස් රජු බුදු දහම පිළිගෙන අනුග්‍රහ දැක්වීම (------)

24. අනුරාධපුර රාජධානිය පිරිහීයාම සම්බන්ධ නිවැරදි ප්‍රකාශය

A සොළී අධිරාජයින්ගේ ව්‍යාප්තවාදී ප්‍රතිපත්ති

B මාඝ ආක්‍රමණය

C දුර්වල පාලකයින් බලයට පත්වීම

D රජරට පුරා මැලේරියා වසංගතය පැතිරී යාම (------)

25. පළවන විජයබාහු රජුගේ කාර්ය සංසිද්ධිය සම්බන්ධ නිවැරදි ප්‍රකාශ

A ශ්‍රී ලංකාව එක්සේසත් කිරීම

B සොළී පාලකයින් සමග විවාහ සම්බන්ධතා ඇරඹීම

C පොළොන්නරුවේ අවසාන බලවත් පාලකයා වීම

D පොළොන්නරු කතිකාවත පැවැත්වීම (------)

නිවැරදි පිළිතුර තෝරන්න

26. පණ්ඩුකාභය රජුගේ ගුරුවරයා නම් කරන්න

1. චන්ද්‍ර 2. පුලහත්ථ 3. දීඝාභය 4. අභය 5. පණ්ඩුල (------)

27. මෙරට ඉදිකළ පළමුවන චෛත්‍යය නම් කරන්න

1. රුවන්වැලිසෑය 2. අභයගිරිය 3. ථූපාරාමය 4. වෙස්සගිරිය 5ඉසුරුමුණිය (------)

28. වළගම්බා රජුට මුහුණදීමට සිදුවූ අභියෝගයක් නොවන්නේ මින් කුමක්ද?

1. තිය බ්‍රාහ්මනයාගේ කැරැල්ල 2. කණිශිව ආදී ගම් නායකයින්ගේ සහය ලබා ගැනීම

3. මහාරත්ථක සෙනවියා පැරදවීම 4. ඒකනාලිකසාය

5. සප්ත ද්‍රවිඩ ආක්‍රමණය (------)

(29) මෙරට දොළොස් දහසක් ජනයා ඉන්දියානු සිර කරුවන් ලෙස ඉන්දියාවට රැගෙන යන ලද්දේ කුමන රාජ්‍ය සමයේදීද?

1. වසභ රජු සමයේ 2. වංකනාසික තිස්ස රජ සමයේ

3. දෙවන සේන රජ සමයේ 4. වෝහාරික තිස්ස රජ සමයේ

5. පස්වන මිහිඳු රජ සමයේ (------)

(30) මානවම්ම රජුට ආධාර ලබාදුන් ඉන්දියානු රජ්‍යය වන්නේ

1 සොළී රාජයය | 2. මෞර්ය අධිරාජ්‍යය | 3. [illegible]
4. කාලිංග රාජ්‍යය | 5. පල්ලව රජ්‍යය

(31) මහාවංසයට ලියවුනු ගැටපදය හැදින්වූ නාමය වන්නේ

1. දම්පියා අටුවා ගැටපදය | 2. ගට්ඨපදට්ඨ වර්ණනා
3. වංසත්තප්පකාසිනීය | 4. හෙරණසිබ
5. විසුද්ධිමාර්ගය (------)

(32) ධාතුසේන රජු ඉදිකළ ප්‍රධාන ඇළමාර්ගයක් වන්නේ

1 පබ්බතන්ත 2. ඇළහැර 3 යෝධ ඇළ 4. මිණිපේ 5. කාලිංග ඇළ (------)

(33) පොළොන්නරු යුගයේ මෙරට දේශපාලන කටයුතු වලට වඩාත් බලපෑ විදේශීය රාජ්‍ය දෙක වන්නේ

1.මෞර්ය -ගුප්ත 2. සොළී-පාණ්ඩ්‍ය 3. සොළී-පල්ලව
4. කේරළ-පාණ්ඩ්‍ය 5. කාලිංග-පාණ්ඩ්‍ය (------)

(34) පළවන විජයබාහු රජු කගරගම බලය ලබාගත් වර්ෂය වූයේ

1. ක්‍රි.ව. 1070 2. ක්‍රි. ව. 1029 3. ක්‍රි.ව. 1055 4. ක්‍රි.ව.1050 5. ක්‍රි.ව. 1067 (------)

(35) පලවන පරාක්‍රමබාහු රජු ප්‍රථමයෙන්ම පාලනය කළ ප්‍රදේශය වන්නේ

1. මායා රට 2. රුහුණ 3. අටදහස් රට 4. රජරට 5 දොළොස්දහස් රට (------)

**පහත ප්‍රශ්න වල දැක්වෙන ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන අංකය පහත වගුවෙන් තෝරාජ්ජී අංකය සටහන් කරන්න.**

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | සත්‍යය | අසත්‍යය |
| 2 | අසත්‍යය | සත්‍යය |
| 3 | සත්‍යය | සත්‍යය |
| 4 | අසත්‍යය | අසත්‍යය |
| 5 | සත්‍යය | පළවැනි ප්‍රකාශය සත්‍ය වන අතර ඒ ප්‍රකාශය මැනවින් පහදයි |

| | | |
|---|---|---|
| (36) පැරණි ලාංකිකයෝ සමෝච්ඡකරණය හා භූමියේ පිහිටීම මැනවින් හඳුනාගෙන වාරි නිර්මාණ කටයුතු වල යෙදුනහ. | අතීතයේ වාරි නිර්මාණ කටයුතු පාලකයින්ගේ වගකීමක් විය | |
| (37) බුදල්නා විසින් පළවන විජයබාහු රජුට කුඩාකාලයේ ආරක්ෂාව සපයන ලදී. | බුදල්නා විජයබාහු රජුට අටමහා සෙනවියන්ගෙන් යුක්ත හමුදාවක් විජයබාහු රජුට සකස් කර දෙන ලදී | |
| (38) මහා පරාක්‍රමබාහු රජුගේ පාණ්ඩ්‍ය ආක්‍රමණය මෙහෙයවන ලද්දේ කිත්නුවරගල් සෙනවියා විසිනි. | සිංහල හමුදාව විසින් කුලසේකර මදුරාපුර සිහසුනට පත් කරන ලදී. | |
| (39) පළවන විජයබාහු රජු තුලාබාර දාන තුනක් දුන් බව සඳහන්වේ | නිශ්ශංකමල්ල රජු මෙරට සෙල් ලිපි පිහිටවූ රජවරුන් අතරින් පළමු තැන ගන්නා අයෙකි. | |
| (40) කැලණිය මුල් ඓතිහාසික යුගයේ ප්‍රාදේශීය රජ්‍යයක් ලෙස පැවතුනි. | සුගලා බියව සතුව දළදාව පැවතීම නිසා පළමු පරාක්‍රමබාහු රජුට විරුද්ධව රුහුණේ කැරළි ඇතිවිය | |

# ද මැසිනොද් විදුහල, කඳාන

## ඉතිහාසය I I

ශ්‍රී ලංකාවේ ඉතිහාසය-අතීතයේ සිට කි. ව. 1978 දක්වා (25 S-I) කාලය පැය 2

මෙම කොටස ප්‍රශ්න 7 කින් සමන්විත වේ. පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

(1) ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කොට නම් කරන්න.ඉන් ස්ථාන දෙකක් පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න

1. නාගදීප 2. දැදුරු ඔය 3. පොළොන්නරුව 4.මන්නාරම
5. දෙවිනුවර 6. කතරගම 7. කලා වැව 8. අටදහස් රට

(2) 1. මුල් ආර්ය ජනපද පිහිටවූ ප්‍රධානීන් දෙදෙනෙකු නම් කරන්න (ලකුණු 2)
2. මෙරටට පැමිණි මුල් ආර්ය සංක්‍රමණික කණ්ඩායම් පිළිබඳව විස්තරයක් ලියන්න (ලකුණු 5)
3. රජරට වියළි කලාපය තුළ සිය මුල් ජනාවාස පිහිටුවාගත් ආර්ය ජනයාගේ කෘෂිකාර්මික ජීවනෝපාය සැකසීමෙහිලා මෙරට භූගෝලීය පිහිටීම බලපෑ ආකාරය පැහැදිලි කරන්න (ලකුණු 7)

(3) මෙරට දේශපාලන ස්ථාවරභාවය ආරක්ෂා කිරීමෙහිලා වළගම්බා රජුගෙන් ඉටුවූ සේවය පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කරමින් පැහැදිලි කරන්න.
මුහුණදුන් අභියෝග
සටන් සංවිධානය කිරීම
ආගමික සේවාව (ලකුණු14)

(4) ක්‍රි.පූ. 3 වන සියවසයේ සිට ක්‍රි.ව 6 වන සියවසයේ අවසානය දක්වා වාරිමාර්ග ක්‍රමය වර්ධනයවූ ආකාරය පහත සඳහන් මාතෘකා යටතේ සාකච්ඡා කරන්න
වැව් හා ඇළමාර්ග තැනීමෙහිලා රජවරුන් ඉටුකළ කාර්යය
වාරි තාක්ෂණය (ලකුණු14)

(5) වසර 1500 අධික කාලයක් මෙරට අගනුවර ලෙස පැවති අනුරාධපුර රාජධානිය බිඳවැටීමට බලපෑ සාධක විස්තර කරන්න (ලකුණු14)

(6) මහා පරාක්‍රමබාහු රජතුමා පොළොන්නරු යුගයේ සිටි ශ්‍රේෂ්ඨ නරපතියෙකි.
පහත දැක්වෙන තේමා යටතේ ඒතුමාගේ ශ්‍රේෂ්ඨත්වය විවේචනාත්මකව පරීක්ෂා කරන්න
රට එක්සේසත් කිරීම
ආර්ථික සංවර්ධන කටයුතු
විදේශ ප්‍රතිපත්තිය (ලකුණු 14)

(7) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳව සටහන් ලියන්න
1. බුදුදහම පැමිණීමට පෙර පැවති ආගමික විශ්වාශ
2. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් වශයෙන් අභිලේඛන වල වැදගත්කම
3. පළවන විජයබාහු රජුගේ සටන් ව්‍යාපාරය
4. රුහුණු රාජ්‍යයේ ආරම්භය
5. නිශ්ශංකමල්ල රජතුමා (ලකුණු7x 2)

# ද මැසිනොද් විදුහල, කඳාන

2016.07.28

ඉතිහාසය I

යුරෝපා ඉතිහාසය- (25 S-I) 12 - ............ කාලය පැය 1

Learning Resource Center
R
De Mazenod College
Kandana

මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(1) 1 ස්පාඤ්ඤය 2. පෘතුගාලය 3. ඉතාලිය
4. ආජන්ටිනාව 5. ජර්මනිය (-----)

(2) 1. ප්‍රවේණිය 2. භූවමාරු ආර්ථිකය 3. වංශාධිපතීන්
4. ප්‍රවේණිදාසයා 5. කොන්සල්වරු (-----)

(3) 1. රිචලියු 2. මැසරින් 3. පින්ඩාර්
4. සලි 5. වුල්සි (-----)

(4) 1. ජීන් බෝඩැන් 2. රෆායල් 3. ඩාවින්චි
4. මැසැක්සියෝ 5. මයිකල්ඇන්ජලෝ (-----)

(5) 1. වෙනිස් 2. මිලාන් 3. ගොන්ගාසා
4. ෆ්ලොරන්ස් 5. ජිනෝවා (-----)

(6) 1. ප්‍රාග් නුවර හස් 2. ජෝන් වෛක්ලිෆ් 3.ජෝන් කැල්වින්
4. උල්රිච් ස්වින්ග්ලි 5. ජෝන් ලොක් (-----)

(7) 1. ජොහැන්ස් කෙප්ලර් 2. විලියම් ෂේක්ස්පියර් 3. ගැලීලියෝ ගැලිලි
4. අයිසැක් නිව්ටන් 5. කොපර්නිකස් (-----)

(8) 1.ඉරාස්මස් 2. කබ්රාල් 3. මැගලන්
4. වස්කෝ ද ගාමා 5. කොලොම්බස් (-----)

(9) 1පස්වන චාල්ස් 2. දෙවන පිලිප් 3. ඉසබෙලා
4.හතරවන හෙන්රි 5. ෆර්ඩිනන්ඩ් (-----)

(10) 1. පැරිස් 2. ලන්ඩන් 3. වෙනිස්
4. බර්ලින් 5. ජිනීවා (-----)

(11) 1. ටයිබර් 2. පිරනීස් 3. තේම්ස්
4. ඩැනියුබ් 5. රයින් (-----)

(12) 1. තුර්කිය 2. නේපල්ස් 3. ක්‍රීට
4. සිසිලි 5. එංගලන්තය (-----)

(13) 1. පයිතගරස් 2. හෙරඩෝටස් 3. හිපොක්‍රටීස්
4. ඩාඩනල්ස් 5. ඇනෙක්සිගෝරස් (-----)

(14) 1. ඔගස්ටස් 2. මාකස් අවුරේලිස් 3. කොන්ස්ටන්ටයින්
4. පින්ඩාර් 5. ඩයක්ලීෂියන් (-----)

(15) 1. ඇතැන්ස් 2. තිබ්ස් 3. ඇක්‍රා පොලිස්
4. ස්පාටා 5. මිලේටස් (-----)

නිවැරදි පිළිතුර තෝරන්න

(16). ග්‍රීක ඉතිහාසයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන්නේ කවර පාලකයාගේ යුගයද?
1. සොලෝන් 2. සෙලෙස්තිනස් 3. හෝමර්
4.පෙරික්ලීස් 5. හිසොහිඩ් (-----)

(17). ග්‍රීක ශිෂ්ඨාචාරයේ ශ්‍රේෂ්ඨ වීර කාව්‍යයක් වූයේ
1. ඇන්ටිගනී 2. ඉලියඩ් 3. ලෙවියතාන්
4. යුටෝපියා 5. ට්‍රෝජන් (-----)

(18) ග්‍රීක ජනයා ආකාශයට අධිපති දෙවියා ලෙස සැලකුවේ
1. ඩයනීසස් 2. ඇතීනා 3. සියුස්
4. පොසයිඩන් 5. මාර්ස් (-----)

(19) හෙලනිස්ටික් යුගය ඇරඹීමට මූලිකවූ ලියවර තබන ලද පාලකයා වූයේ
1. මහා ඇලෙක්සැන්ඩර් 2. පෙරික්ලීස් 3. සොලෝන්
4. ඔගස්ටස් 5. නීරෝ (-----)

(20) අවසාන රාත්‍රී භෝජනය නම්වූ සුප්‍රකට චිත්‍රය නිර්මාණය කරන ලද්දේ
1. රෆායල් 2. මයිකල්ආන්ජලෝ 3. ඩොනටෙලෝ
4. මැසැක්සියෝ 5. ඩාවින්චි (-----)

(21) නූතන ජාතික රාජ්‍ය වල රජවරුන්ට පදනම සැපයූ කුමාරයා ග්‍රන්තය රචනා කළේ කවුද?
1. තෝමස් හොබ්ස් 2. ඇල්බට් වොලන්ස්ටයින් 3.ජීන් බෝඩෑන්
4. නිකලෝයි මැකියාවෙලි 5. ඩෙසිඩේරිස් ඉරාස්මස් (-----)

(22) එංගලන්තය ජාතික රාජ්‍යයක් බවට පත්වූයේ කුමන රජ පෙළපත යටතේද?
1. බූර්බන් 2. ටියුඩර් 3. හැප්ස්බර්ග්
4. වැලූවා 5. ඔරෙන්ජ් (-----)

(23) දේශගවේශන ව්‍යාපාරය සඳහා උරදුන් ස්පාඤ්ඤ ජාතික රජෙකු වන්නේ
1. ෆර්ඩිනන්ඩ් 2. හත්වන හෙන්රි 3. නාවික හෙන්රි
4. අටවන හෙන්රි 5. හතරවන හෙන්රි (-----)

(24) ප්‍රථම වරට ලොව වටා යාත්‍රා කරන ලද නාවිකයා කවුද?
1. වස්කෝ ද ගාමා 2. ක්‍රිස්ටෝපර් කොලොම්බස් 3. හෙන්රි හඩ්සන්
4. ෆර්ඩිනන්ඩ් මැගලන් 5. ජැක්විස් කාටියර් (-----)

(25) රෙපරමාදු ධර්මය ආරම්භවූ රට කුමක්ද?.
1. ප්‍රංශය 2. ස්පාඤ්ඤය 3. ජර්මනිය
4. ඉතාලිය 5. ස්විට්සර්ලන්තය (-----)

(26) පාලකයාගේ ආගම වැසියාගේ ආගම විය යුතුය යන නීතිය පනවන ලද ගිවිසුමේ නම කුමක්ද?
1. පැරිස් 2. නැන්ට්ස් 3. ඖස්බර්ග්
4. මැග්නා කාර්ටා 5. මිලාන් (-----)

(27) රිචලියු විසින් ප්‍රංශයේ ප්‍රාදේශීය පාලන කටයුතු වලට සම්බන්ධ කරගත් පුද්ගලයින් හැදින්වූ තනතුරු නාමය වූයේ
1. හියුගිනෝවරු 2. ඉන්ටෙන්ඩාන්ට්වරු 3. ප්‍රිෆෙක්ට්වරු
4. මොරිස්කෝනවරු 5. ජෙසුයිට්වරු (-----)

(28) ප්‍රථම වරට ක්‍රිස්තියානි ධර්මය වැළඳගත් රෝම අධිරාජ්‍යයා වූයේ කවුද?
1. කොන්ස්ටන්ටයින් 2. නීරෝ 3. ඩයක් ලීෂියන්
4. ඔගස්ටස් 5. තියඩෝසියස් (-----)

(29) රෙපරමාදු ව්‍යාපාරයට ආසන්නතම හේතුව වූයේ මින් කුමක්ද,
1. ජෙසුයිට් ව්‍යාපාරය වර්ධනයවීම 2. පල්ලිය ධනය රැස්කරන ආයතනයක් වීම
3. පූජකවරු ලෞකික ජීවිත ගත කිරීම 4. පූර්නඵල ව්‍යාපාරය
5. පල්ලියේ ඉඩම් ලබාගැනීමට ජනතාවට තිබූ අවශ්‍යතාව (-----)

(30) පුනරුද සමයේ කලාවට අනුග්‍රහ දැක්වූ පාප්වරයෙකු වූයේ
1. දහ වන ලියෝ 2 දෙවන නිකලස් 3. පළවන පාවුලු
4. දෙවන ඇලෙක්සැන්ඩර් 5. තුන්වන ඉන්සෙන්ට් (-----)

පහත ප්‍රශ්න වල දැක්වෙන ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන අංකය පහත වගුවෙන් තෝරාඒහි අංකය සටහන් කරන්න.

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | සත්‍යය | අසත්‍යය |
| 2 | අසත්‍යය | සත්‍යය |
| 3 | සත්‍යය | සත්‍යය |
| 4 | අසත්‍යය | අසත්‍යය |
| 5 | සත්‍යය | පළවැනි ප්‍රකාශය සත්‍ය වන අතර ඒ ප්‍රකාශය මැනවින් පහදයි |

| | | | |
|---|---|---|---|
| 31 | පැරණි ග්‍රීසියේ සොෆිස්ට් වරු හෙවත් විතණ්ඩවාදීහු වූහ | මුල්ම ග්‍රීක දාර්ශනිකයින් ලෙස තේල්ස් හා ඇනෙක්සිමැන්ඩර් සැළකිය හැකිය. | |
| 32 | ග්‍රීක සමාජයේ බහු දේව වාදයක් පැවතුනි | අහසට අධිපති ඇපලෝ දෙවියන් ප්‍රධාන කොටගත් දේව මණ්ඩලයක් ග්‍රීක ජනයාගේ වන්දනයට පාත්‍රවිය | |
| 33 | රෝම අධිරාජ්‍යය හා කාර්තේජය අතර පැවති යුද්ධය පියුනික් යුද්ධ ලෙස හැඳින්වේ. | දෙවන පියුනික් යුද්ධ අවසානයේදී කාර්තේජය බලය තහවුරු කරගෙන මධ්‍යධරණී කලාපයේ අධිරාජ්‍යයක් පිහිටුවා ගන්නා ලදී. | |
| 34 | බටහිර රෝම අධිරාජයයට එල්ලවූ මුස්ලිම් ආක්‍රමණ වැඩවසම් ක්‍රමය බිහිවීමට බලපෑවේය | වැඩවසම් ක්‍රමය ආර්ථික සමාජ හා දේශපාලන ක්‍රමයක් ලෙස යුරෝපයේ ව්‍යාප්තවිය. | |
| 35 | මධ්‍යතන යුගයේ සමාජ තරාතිරම උපතින්ම තීරණය විය | ඉඩම පදනම් කරගෙන සියලු දෙනා එකට බැඳ තබන සමාජ රටාවක් මධ්‍යතන යුගයේ විය | |
| 36 | මාටින් ලූතර් දේව ධර්මය පිළිබඳ මහාචාර්ය වරයෙකු විය. | ජර්මනියේ තියුරිංගියාවේ උපන් මාටින් ලූතර් විටෙන්බර්ග් විශ්ව විද්‍යාලයේ කටයුතු කළ අතර රෙපරමාදු දහමේ නිර්මාතෘ වරයා විය. | |
| 37 | කබ්රාල් බ්‍රසීලය ගවේශනය කළේය | දේශගවේශන නිසා යුරෝපා රටවල් ආර්ථික අතින් බලවත් විය | |
| 38 | රිචලියු රදළයින්ගේ අධිකරණ බලතල සීමා කළේය | රිචලියු තිස් අවුරුදු යුද්ධයේදී ශුද්ධ රෝම අධිරාජයයාට සහය විය. | |
| 39 | ෆර්ඩිනන්ඩ් හා ඉසබෙලා යුවල ප්‍රංශය ජාතික රාජ්‍යයක් කිරීමේ මූලික පියවර තබන ලදී | ෆර්ඩිනන්ඩ් හා ඉසබෙලා යුවල දේශ ගවේශකයින්ට ආධාර දෙමින් තම රටේ ආර්ථිකය දියුණු කිරීමට කටයුතු කළහ | |
| 40 | රෝස යුද්ධය අවසානේ අටවන හෙන්රි රජු එංගලන්තයේ පාලන බලය ලබා ගත්තේය. | අටවන හෙන්රි රජු ටියුඩර් යුගයේ සිටි අවසාන බලවත් පාලකයා විය. | |

# ද මැසිනොද් විදුහල, කඳාන

Learning Resource Center
2016.07.28
De Mazenod College
Kandana

ඉතිහාසය II

යුරෝපා ඉතිහාසය- (25 S-I) 12-3වන වාරය කාලය පැය 2

මෙම කොටස පශ්න 7 කින් සමන්විත වේ. පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

(1) ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කොට නම් කරන්න.ඉන් ස්ථාන දෙකක් පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න

| | | | |
|---|---|---|---|
| 1. රෝමය | 2. එංගලන්තය | 3. මධ්‍යධරණී මුහුද | 4. ප්‍රංශය |
| 5. රයින් ගග | 6. ලිස්බන් | 7. කලු මුහුද | 8. ස්පාඤ්ඤය |

(2) 1. ග්‍රීක පෞර රාජ්‍ය දෙකක් නම් කරන්න (ලකුණු 2)
2. පෞර රාජ්‍ය තුළ දක්නට ලැබුණු ග්‍රීක දර්ශනය පිළිබඳව විස්තර කරන්න (ලකුණු 5)
3. ග්‍රීක රාජ්‍ය වල දක්නට ලැබුණු ආණ්ඩුක්‍රම පිළිබඳව විස්තර කරන්න (ලකුණු 7)

(3) 1. මධ්‍යතන යුරෝපයේ පැවති වැඩවසම් ක්‍රමයේ මූලික ලක්ෂන මොනවාද? (ලකුණු 7)
2. එම ක්‍රමය පරිහානියට පත්වීමට බලපෑ හේතු පැහැදිලි කරන්න (ලකුණු 7)

(4) ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය මුල්කොටගෙන බටහිර යුරෝපයේ පැවති ආගමික එක්සත්භාවය බිඳ වැටුණි.
1. ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ ප්‍රධාන නායකයින් දෙදෙනෙකු නම් කරන්න (ලකුණු 2)
2. ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ජර්මනියෙන් ආරම්භවූයේ මන්දැයි පහදන්න. (ලකුණු 3)
3. ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ඇතිවීමට තුඩුදුන් සාධක කෙටියෙන් දක්වන්න (ලකුණු 4)
4. ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ ප්‍රතිඵල ඇසුරින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න (ලකුණු 5)

(5) දේශගවේශන ව්‍යාපාරය මධ්‍යතන යුරෝපය නූතන යුරෝපය බවට පත් කිරීමෙහිලා බලපෑ ප්‍රධාන සාධකයකි.
1. 15 වන සියවසයේ දෙවන භාගය වන විට යුරෝපා ජාතීන් දේශගවේශන කටයුතු සඳහා යොමු වීමට බලපෑ හේතු මොනවාද? (ලකුණු 7)
2. මෙම දේශගවේශන කටයුතු සම්බන්ධයෙන් පෘතුගාලයේ දායකත්වය පැහැදිලි කරන්න (ලකුණු 7)

(6) ප්‍රංශය 17 වන සියවසයේ යුරෝපයේ බලවත්ම රාජ්‍යය විය. ප්‍රංශය එම තත්වයට පත් කිරීමෙහිලා රිචලියුගෙන් ඉටුවූ සේවය පැහැදිලි කරන්න (ලකුණු 14)

(7) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් සඳහා කෙටි සටහන් ලියන්න
1. රෝම නීතිය
2. මානුෂවාදය
3. ප්‍රතිරෙපරමාදූ ව්‍යාපාරයේ ප්‍රධාන අංග
4. හතරවන හෙන්රි රජුගේ පාලනය
5. එංගලන්තයේ ටියුඩර් යුගය (ලකුණු 7x2)

28.07.2016

AL/2007/25-S/I/E-I

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka


ඉතිහාසය I
வரலாறு I
History I

25

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2007

ප්‍රශ්න අංකය
வினா இல.
Question No. 10

විභාග අංකය
சுட்டெண்
Index No. ..............................



3194

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

ඉතිහාසය II
வரலாறு II
History II

25-B

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2003 අප්‍රේල්
கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 2003 ஏப்பிரல்
General Certificate of Education (Adv. Level) Examination, April 2003

| | | | |
|---|---|---|---|
| ප්‍රශ්න අංකය<br>வினா இல<br>Question No. | 10 | විභාග අංකය<br>சுட்டெண்<br>Index No. | |

